**පන්විල ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

2015 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් ශේෂය පරිග්‍රහණ ලේඛනය අනුව රු.1,409,710 ක් වුවත්, එය රු.1,394,501 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් පුස්තකාල පොත් රු.15,209 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 ලැබියයුතු ගිණුම්.

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ අයිතම 16 ක එකතු වටිනාකම රු.8,558,552 ක් විය. එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,010,324 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.3,010,864 ක් වී තිබුණි.

#### 1.3.3 ගෙවියයුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතු වටිනාකම රු.8,571,548 ක් විය. එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,708,041 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,636,879 ක් වී තිබුණි.

#### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

රු.6,210,435 ක් වටිනා ඉඩම් කොටස් 34 ක් සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග ඉදිරිපත් නොකිරීමෙන්, එම ශේෂය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

#### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) චක්‍රලේඛ<br>------------ | |
| (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/ඩීඑස්06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ, චක්‍රලේඛය. | නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.34,000 ක ඇප මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය. | කඩ කාමරවල තක්සේරු කුළිය වසර 05 කට වරක්වත් සංශෝධනය කළයුතු වුවත්, සභාව විසින් 2009 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් සිදු කර නොතිබුණි. |
| (ආ) වෙනත්<br>-------- | |
| 2015 ජනවාරි 02 දිනැති අංක 1896 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය | රු.72,177 ක් වූ දැන්වීම් පුවරු 89 ක් සඳහා ගාස්තු අය කර ගෙන නොතිබූ බව පන්විල නගරයේ ඔරලෝසු කණුව දෙපස ප්‍රධාන මාර්ගයේ 2015 දෙසැම්බර් 02 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අණාවරණය විය. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,857,121 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.390,146 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,466,975 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 දිනට | | 2015 වර්ෂය | | | 2015 ලැබීම් | | | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | හිග ශේෂය | ඉදිරියට ලැබීම් | බිල් කිරීම් | අධි ගාස්තු | දුන් වට්ටම්/ කපා හැරීම් | ඉදිරියට ලැබීම් | හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වරිපනම් හා බදු** | **580,102** | **93,230** | **889,758** | **54,151** | **40,079** | **113,665** | **405,887** | **724,016** | **374,465** |
| **බදු කුළී** | **58,300** | **--** | **360,000** | **15,900** | **--** | **--** | **55,100** | **329,600** | **49,500** |
| **බලපත්‍ර ගාස්තු** | **39,300** | **--** | **1,434,100** | **--** | **--** | **4,000** | **31,300** | **1,424,600** | **21,500** |
| **වෙනත් ආදායම්** | **1,505,015** | **2,905** | **2,633,308** | **4,604** | **--** | **3,970** | **1,241,304** | **1,252,011** | **1,650,677** |
| **එකතුව** | | | | | | | | | **2,096,142** |

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.2,096,142 ක හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.2.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු ශේෂය රු.322,239 ක් වූ අතර, මෙම හිගය අවුරුදු 01 ත් අවුරුදු 12 ත් අතර කාල පරාසයකට අයත් විය. මේ සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රජයේ ආයතන 06 කින් අය වියයුතු හිග ශේෂය රු.36,078 ක් වූ අතර, මෙම හිගය මාස 03 ත් අවුරුදු 07 ත් අතර කාල පරාසයකට අයත් විය. මෙම හිග මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්.

(අ) ජල ගාස්තු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 ජනවාරි 01 දිනට හිග ජල ගාස්තු ආදායම රු.186,510 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම රු.711,625 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දින විට අය කර තිබුණේ පිළිවෙළින් රු.135,021 ක් හා රු.518,415 ක් පමණි. මෙම හිගයෙන් හා බිල් කිරීමෙන් අය කිරීම ප්‍රතිශතයක් ලෙස සියයට 72 ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට හිග ජල ගාස්තුව රු.245,764 ක් වූ අතර, මේ සම්බන්ධයෙන් 1987 දරණ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) සභාව සතු ජල යෝජනා ක්‍රමයන්ට අදාළව මුළු ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 597 ක් වූ අතර, ජල මනු සවි කිරීමකින් තොරව ස්ථාවර ජල ගාස්තුවක් අය කර තිබුණි.

(ආ) අක්කර බදු.
--------------
2015 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.50,612 ක් වූ අතර, මින් 2015 දෙසැම්බර් 31 දින වන විටත්, අය කර තිබුණේ රු.18,366 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 36 ක් විය. මේ අනුව, හිඟ අක්කර බදු අය කිරීම දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම, 2015 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.52,226 ක් වූ අතර, මෙම හිගය අවුරුදු 01 ත් අවුරුදු 15 ත් අතර කාල පරාසයකට අයත්ව පැවතුණි.

(ඇ) ත්‍රී රෝද රථ ගාස්තු.
-----------------------
2015 ජනවාරි 01 දිනට හිඟ ත්‍රී රෝද රථ ගාස්තු රු.127,950 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම රු.170,000 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.60,410 ක් හා රු.43,490 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 47 ක් හා සියයට 25 ක් විය. මේ අනුව, ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි වී තිබූ ත්‍රී රෝද රථ 103 කින් රු.149,050 ක් හිඟව තිබූ අතර, මෙම හිගය අවුරුදු 01 ත් අවුරුදු 03 ත් අතර කාල පරාසයකට අයත් විය. මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රචාරක දැන්වීම් පුවරු.
------------------------
2015 ජනවාරි 01 දිනට හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තුව රු.81,027 ක් වූ අතර, මින් 2015 දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ රු.14,940 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 18 ක් විය. එමෙන්ම, 2015 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු බිල් කිරීම රු.135,427 ක් වූ අතර, මෙයින් කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි. මේ අනුව, ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**
**---------------------------**

**3.1 කාර්යසාධන ඇගයීම.**
**-------------------------**

පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර, ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරින්ගේ ඇස්තමේන්තු ලබා ගෙන අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා මාර්ග සංවර්ධන කටයුතු සඳහා රු.10,831,000 ක් දළ අගයක් ලෙස යොදා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කරවා ගෙන තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**
**------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසළ බැහැර කිරීම සඳහා යොදා ගෙන තිබූ මොරහෙළ ප්‍රදේශයේ ඉඩමෙන් හා හුළගග ප්‍රදේශයේ අක්කර 01 ක පමණ ඉඩමෙන් කුඩා ඉඩකඩක් කසළ බැහැර කිරීම සඳහා යොදා ගෙන තිබූ අතර, ඉතිරි භූමි ප්‍රමාණය ඵලදායී කටයුත්තකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනවසර ඉදි කිරීම් සම්බන්ධව 2015 දෙසැම්බර් 02 දින ස්ථාන කීපයක කරන ලද නියැදි පරීක්ෂාවේ දී අනවසර ඉදි කිරීම් 05 ක් නිරීක්ෂණය වූ අතර, එම ඉදි කිරීම් සම්බන්ධව ගාස්තු අය කර, නියමානුකූල කිරීමට හෝ එසේ නොහැකි ඉදි කිරීම් සම්බන්ධව නීත්‍යානුකූල පියවරක් අනුගමනය කිරීමට ද කටයුතු කර නොතිබුණි

**3.3 ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.**

**--------------------------------**

දිරන හා නොදිරන ලෙස කසළ වර්ගීකරණයකින්යුතුව රැස් කර බැහැර කිරීම සඳහා කටයුතු කළයුතු වුවත්, නිසි වැඩපිළිවෙළක් අනුගමනය කිරීමකින් තොරව දිරන හා නොදිරන සියලුම කසළ එකට රැස් කර, මොරහෙළ හා හුළුගග ප්‍රදේශයේ ස්ථානවලට බැහැර කර තිබුණි. එසේම, එය මාර්ගයට යාබද බෑවුමක් සහිත ස්ථානයක් වූයෙන් පහත් භූමියක් කරා කසළ තල්ලු වී යාමෙන් වැසි ජලය සමග මුසුව පහළ ප්‍රදේශවල ජල මූලාශ්‍ර අපවිත්‍ර වීමට ඉඩ ඇති බව 2015 දෙසැම්බර් 02 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අණාවරණය විය.

**3.4 පාරිසරික ගැටළු.**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසළ බැහැරලන ස්ථානය අවට ප්‍රදේශය ඉතා දුර්ගන්ධය සහිත වුව ද, ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) මොරහෙළ කසළ බැහැරලන භූමියට යාබද භූමිය තුළ අළෙවි කළ හැකි කසළ ද්‍රව්‍ය එක් රැස් කරන අනවසර ස්ථානයක් පවත්වා ගෙන යමින් තිබූ අතර, එළිමහනේ එම ද්‍රව්‍ය රඳවා තිබීම හේතුවෙන්, එහි ඇති ටින් හා ප්ලාස්ටික් කොටස් තුළ වැසි ජලය රැස් වී පවතින බවත් 2015 දෙසැම්බර් 02 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් සෞඛ්‍ය ගැටලු ඇති වීමේවැඩි ප්‍රවණතාවයක් පැවතුණි.

(ඇ) ලෝක උරුම නකල්ස් රක්ෂිතය ආසන්නයේ පිහිටි ජෛව විවිධත්ත්වයෙන් හෙඹි වැසි වනාන්තරයක් ලෙස ප්‍රකට භූමියට නිසි කළමනාකරණයකින් තොරව කසළ බැහැරලීම හේතුවෙන් දැඩි පාරිසරික ගැටලු නිර්මාණය වී තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**4.1 අයවැය පාලනය.**

**------------------**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තු ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම සමග සැසඳීමේ දී, ආදායම් විෂයයන් 04 ක සියයට 15 සිට සියයට 97 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 17 සිට සියයට 95 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය.**

**----------------------**

අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

**------------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**------------------------------------------**

රු.6,035,600 ක් වටිනා ඩම්ප් ට්‍රක් රථය හා ට්‍රේලරය ඌන උපයෝජිතව පැවති අතර, රු.525,000 ක් වටිනා යතුරු පැදි 02 ක් සහ අත් ට්‍රැක්ටරයක් අවුරුදු 01 ත් අවුරුදු 09 ත් අතර කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**5. පද්ධති හා පාලනය.**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ණයගැති/ ණයහිමි පාලනය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය